කස්තිරම

ඩී බී කුරුප්පු

විප්‍රවාසී කවියන්ගේ ඇසින්

''මා පියන් මව් බිමේ
සැවොම අප දුරු රටේ
ගතින් අප මේ රටේ
සිතින් අප මව් බිමේ''
මේ පාලිත ගනේවත්තගේ කවි පෙළකින් උපුටා ගත්තකි. (බොදවූ ලොව) ඔහුගේ දෙවැනි කවි පොත වන ''ඇසි පියෙහි'' එයම වෙනත් අයුරකින් දැක්වෙයි.

''නොරට සිට නෙත වසා
මේ බිම දකිමි
නෙත හැර බැලූ කල
නොරම හිඳිමි.''

ඉහතින් දැක්වූයේ විප්‍රවාසී සිංහල කවියන් - ලේඛකයන් බොහෝදෙනාට පොදු හැඟීමක් යයි සිතමි. කලින් ලිපියකින් විප්‍රවාසී සිංහලයන් ගැන මබ් බිමේ සිට ලියූ හී.බ. දිසා-නායකගේ 'අක්මුල් නැති මිනිස්සු'' ගැන ලිවීමෙන් පසු විප්‍රවාසී ලේඛකයන් තමන් වසන රට ගැන - එහි ගත කරන දිවිය ගැන බලන බැල්ම කෙබඳුදැයි සොයන්නට මා අතට පත්වූ කවි පොත් කිහිපයක් කියවූයෙමි.

සෝමරත්න දිසානායක ලියූ ''සුදු කාසි හිඟන්නෙක්'' අනෙක් පොත්වලින් කැපී පෙනෙන්නෙකි. මව්බිමේ දී කළ රචනා සෑහෙන ගණනක් සහිත එම පොතට අයත් මෙරට ලියූ කවිවලින් ඔහු පැහැදිලිව කියන දෙයක් ඇත. ඒ තමා මෙහි පැමිණියේ එක් අරමුණක් සහිතව බවය.

''ලොම් කබායක් තුළින් වෙවිලමින් සීතලෙන්
සුදු කාසි අතුලමින් මල්ලකට පුරවමි
ටිකක් හෝ පිරුණු පසු
යළි හඹා පැමිණෙමි.''
ඔහු එසේ ආපසු යන්නේද අරමුණක් ඇතිවය. ඒ

''දෝසි රට කාසි මල්ලක් අරන්
පසු දිනක හඹා විත් හැකි සැණින්
එකතු වී ඔබ සමග
ලියන්නට රඟන්නට හැකි ලෙසින්'' ය.

ඔහුගේ අභිප්‍රාය අපට වටහා ගත හැකිය. එය එක එල්ලේම පවසන්නකි. ''පෙර කළ පවකි ඉපදුන බිම හැරයාම'' යනුවෙන් ඔහු ලියන විට අප පුදුම විය යුතුද නොවේ.
එහෙත් අනෙක් විප්‍රවාසී ලේඛකයන් ගැන එසේ කිව නොහැකිය. ඔවුන් මෙරටට නැතහොත් වෙනත් අපරදිග රටකට (ජපානය බඳු රටකට පවා) ගොස් වාසය කරන්නේ සිය කැමැත්තෙන්ය. එහි ඇති සැපපහසුව නො-හොත් දියුණුවට ඉඩ කඩ නිසාය. විප්‍රවාසීන් සැබැවින්ම නියෝජනය වන සාහිත්‍යයක් නිර්මාණය කළ හැක්කේ ඔවුන්ටය.

''අසිරිමත් ඔසී රට
දයාවෙන් දරු පිරිස
වැළඳ සිප සනසවන
මවක් මෙහි ලෝදනට''
පාලිත ගනේවත්ත ''බොද වූ පොළොවෙහි'' කියන්නේ එයයි.

ජීවිතයේ සන්ධ්‍යා සමයේ මෙහි පැමිණි එල්.බී. ඒකනායක පවා, මේ රටේ සිරියාව අගය කරන්නට සමත් විය. ඔහුගේ ''නව මැදිරි කවුළුවේ'' එන කවි පෙළ බොහොමයක් අවසන් වන්නේ මෙම වදන් වලිනි.

''නවෝදය රැගෙන එන
වේදනා පහව යන
තවත් දවසක් දිටිමි
නව මැදිරි කවුළුවෙන්''

තව කෙනෙකු තමන් පිවිසෙන නව ලෝකය දෙස බලන්නේ පුදුමයෙනි.
''යස ඉසුරු පිරි මහා ජය බිම
අරුමයකි මා නෙත ගැටෙන අද
කිසිම දුගියකු නොදුටුවෙමි තව
පැමිණ මෙරටට මසක් ගෙවුණද''
(සුනිල් ගෝවින්නගේ - මතක දිවයින)

විප්‍රවාසී ජීවිතය අභියෝග විරහිත වුවක් නොවේ. මෙහි එන්නත් එයට මුහුණ පෑමට සැරසී ගෙන එන බවත් සැබෑය. විප්‍රවාසී ලේඛකයන් - කවියන් මේ ගැන බලන බැල්ම වැදගත්ය. එයින් පිළිබිඹු වන්නේ ඔවුන්ගේ සැබෑ හැඟීම් හා සිතිවිලි ද? නැතහොත් ගතානුගතික ප්‍රකාශයක්ද?

''මට කලින් පැමිණි වුන් මෙහි සිටියි
උන් පැමිණි දඬු මොණාර මෙහි තිබෙයි
බිම සිටින බොහෝ අය මට පෙනෙයි
අතර මග වැටුන වුන් ගැන දුකයි''

ජගත් ජේ. එදිරිසිංහගේ ''සිසිරයේ පිපුන මලෙහි'' එන තරණය නම් කවි පෙළෙන් මෙසේ කියැවෙන්නේ මෙරටට ආවුන් ගැන යයි සිතමි.

එල්.බී. ඒකනායකගේ ''නව මැදිරි කවුළුවෙන්'' පොතෙහි එන ''මල්දෙණිය'' කවි පෙළෙහි

''සතෙකු මෙන් දිවා රෑ
නොනවතින දිවිල්ලක
යෙදී දැන් හෙම්බත්ව
අබලවද දුබල වී''

මහ මග මැරි වැටෙන සැටියක්ද දැක්වෙයි.

මෙහි ගත කරන දිවිය ගැන කළකිරීමක් අපගේ කවියන් වෙතින් පළවන්නේ ඇයිද යන ප්‍රශ්නය පමණක් මතු කරුණු කැමැත්තෙනි.

''ගෙවා හත් ගව්වක් ම
නොරට විත් දොම්නසින
බිත්ති හතරට මැදිව''
මව් බිමේ සිරිය සිහි පත් කරමින්
''සීතලේ ඇඟිලි ඉදිකටු දැනෙන
සිප් හලට මිණිබිරිය යයි රැගෙන''
යනුවෙන් පාලිත ගනේවත්ත ගේ ''ඇසිපිය'' සංග්‍රහයේ එන ''නොරට සිට'' නම් කවත්, සුනිල් ගෝවින්නගේ ලියූ ''මතක දිවයිනෙහි'' එන මතකය උරුමය කවි පෙළෙහි අගට එන

''රන් කිරි දිවග ගෑ බස නැත දොඩන්නේ
උදේ රැය ද පර බසක් ය දොඩන්නේ
සිසිල නොමැති අව් රස්නෙට දැවෙන්නේ
පිට මිනිසකු ලෙසිනි මේ රට මා රැදෙන්නේ''



යන
කවත්, මගේ
ප්‍රශ්නයට සාධක
වශයෙන් දක්වමි.

විප්‍රවාසී ජීවිතයේ තවත් අලංකාර පැත්තක් පාලිත ගනේවත්තගේ ''සංවාදයක්'' (බොද වූ ලොව) කවි පෙළෙන් නිරූපණය වෙයි.

''ඒකනේ ඔය ඉන්නෙ හැම ලපයි
සිපයියම

කවදාක පිටරටක පයගහපු අයද මුන්

ඒ කාලෙ අපි ආපු කොයිතරම් සුන්දරද
හැම තැනම සුදු අයයි අපියි බර්ගර් අයයි

නිතරෝම කන වැටුනෙ ඉංගිරිසි කතාවයි
දැන් ඉතින් සිලනීස් ඉරිදපෙළොළ වගේමයි''

ඒ අප රැගෙන ආ සාර ධර්මයක්ද? සාරධර්ම පිළිබඳ දරුණු ගැටුමක් සෝමරත්න දිසා-නායකගේ ''සුදු දෙරණක උපන් දුවේ'' නම් කවි පෙළෙහි අග කවෙන් මතු කැරෙයි.

''ඇදී ගිහින් අවට ලොවේ පර දුසිරිත දේට
අපේ ගතිය එපා කියා නිගා දෙමින් ඊට
කරේ දමා බහු කෝලම් ජෝගි නටන දාට
දුවේ කියලා කියන එකක් නැහැ මම පොඩි දූට''

විප්‍රවාසී සාහිත්‍යයෙහි ලා මෙම පරිවර්තනය නොහොත් සංස්කෘතිය විපර්යාසය පිළිබිඹු වන ආකාරය අතිශයින් වැදගත් වනු නිසැකය.

WANT TO GET PR...?

ඕස්ට්‍රේලියාවේ දී
ONSHORE
STUDENT - PR
Have you completed or about to complete your Degree/Diploma?

ශ්‍රී ලංකාවේ දී
OFFSHORE
SKILLED MIGRATION
- A Trade Certificate/ Diploma/ Degree or Professional Qualification?
- Have 1/3/4/6/7 year(s) experience in a skilled occupation or business?

OTHER MIGRATION
Business Owners & Investors/ Visitors/ Spouse/ Parents/ and all other categories
Free Service for Student Migration
IF YOU HAVE BLOOD RELATIVES IN AUSTRALIA IT IS AN ADVANTAGE
YOU SHOULD BE BELOW 45 YEARS
Good Knowledge of English
PROFESSIONAL ADVICE TOWARDS POSITIVE RESULTS

Contact
Hirosh Hemantha Gamage ASA, AAIBF (Snr), MMIA
(Registered Migration Agent No: 0320696)

Multinational Migration Services
20/215, Betula Avenue, Mill Park
Vic 3082, Australia
Tel: 03 97377384/ 0421155152
Fax: 03 94372803

MIA
MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA

AUSTRALIAN MIGRATION SERVICES
245 (3rd Floor), Dharmapala Mw ,
Colombo 07
Tel: +94 11 5500 100 / 94 773770202
Fax: +94 11 2697 243

E-mail: info@multinational.com.au

Sannasa

For More details or FREE Online Assessment Visit Our Web Site
www.multinational.com.au